# මතුගම අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020
# සිංහල සාහිත්‍යය රසාස්වාදය - 11 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

(1) අ. කුස රජු / කුස කුමාරයා

ආ. මදු රජ්ජුරුවෝ / පබාවතීගේ පියා

(11) අ. නන්ද මහ තෙරුන් වහන්සේ

ආ. නන්ද මහ තෙරුන් වහන්සේ රහත් වූ බව නොදත් සෙසු භික්ෂූන් වහන්සේට

(111) අ. වෙසක් පහන කෙටි කතාවේ අම්මා

ආ. ජී බී සේනානායක මහතා

(1v) අ සුදු පැහැති වලාකුළු අහසේ ඉතා ඉහළින් ගමන් ගන්නා අතර අඳුරු වැහි වලාකුළු ඉතා පහතින් ගමන් කරයි.

(v) අ සාගර පලන්සූරිය මහතා

ආ. දැඩි නොවන මෘදු හදවතක් ඇති යන අදහස (ලකුණු 4×5 =20යි )

(2) I. කුඩා කල සිට දන්නා මිතුරකු අධ්‍යාපනයෙන් රැකියාවෙන් උසස් තලයකට පැමිණීමෙන් පසුව වෙනස් වූ ඔහුගේ චර්යාව.

II. දෙපද කාව්‍ය ආකෘතිය.

III. i. අතීතයේ සිදුකළ සතුටු සාමීචි කතා බහ ii. ගමේ ක්‍රීඩා පිට්ටනිවල ක්‍රියාකාරකම්

IV. i. " බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ මිස

එ සඳ ඔබේ මුව 'ග නැගුණු සාද තෙපුල් නෑසේ මට "

" ඒ මත සිටිනා ගල සේ මා අබියස නිහඬය ඔබ "

" බිත්තියේ ඇඳි සේයා රූ එකිනෙක එබී එබී බලයි

නැතියෙන් ඔබ වත හසරැලි මදෙස බලා සිනා නගයි "

" මහදේ ඇඳි ඔබෙ සිතුවම කොහි සැඟවිණි දැයි නොදැනේ "

" ඔබ අසලින් බැහැරට යම් කුමටද ඔබගේ අවසර " යනා දී

ලෙසින් සුදුසු ආකාරයට සපයා ඇති පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න

V. කවියා සරල භාෂාවක් යොදාගෙන තිබේ. "එක් යුගයක ජීවිතයේ සරතැස නිවූ" ..... ආදී වශයෙන් කට වහරට සමීප සරල භාෂාවක් යොදා ගනියි. භාෂාවේ සරල භාවය නිසා කවිය තුළ සජීවී ගුණය ඔප් නැංවේ. එමෙන් ම උපමා භාවිතයෙන් තොරවීම ද සරල භාෂාව කවිය රසවත් වීමට හේතු වේ

(ලකුණු- 25)

## II කොටස

(3) I. පබාවතියගේ මානය බිඳ මඬෙහි ම වැතිර කුස රජතුමාගේ පාද නමස්කාර කරවීම සඳහා.

II. සුරත්ත පල්ලවාභිරාම වූ මෘදු කෝමල පාණි යුගලයෙන්

III. දුර්භෝජන - දුක්ඛසෙය්‍යාදීන් / කටුක ආහාර ගැනීම - කටුක ස්ථානවල හිඳීම

ස්නානපාන රහිත වීමෙන් / නෑම ආදියෙන් තොර වීම

1V. සත් කඩක් කොට කපා සත් රජ දරුවන්ට බෙදා දීම

නැතහොත්

I. සාම්ප්‍රදායික ගැමි ජීවිතයේ සැබෑ ස්වරූපය, සරල ගැමි ජීවන රටාව, දුෂ්කර ගම්මානයක දුප්පත් ගොවියෙකු සතු උදාර මිනිස් ගතිගුණ ය / ගැමියාගේ නිර්ව්‍යාජත්වය, ආගන්තුක සත්කාරයට ලැදි බව, ලාභ ප්‍රයෝජන අපේක්ෂා නොකරන නිහතමානි ගුණය

II. මෙම පද්‍ය පන්තිය සඳහා යොදා ගෙන ඇත්තේ සිව්පද / සදැස් ආකෘතිය යි. එහි වූ රිද්මයානුකූල ස්වරූපය මගින් කවියාගේ සංකල්ප සහෘදයාගේ සිත්තුළ කාවැද්දීමට සමත් වන බැවින් එම ආකෘතිය අන්දැකීමට උචිත එකක් වී ඇත. කවියාගේ හදවතේ උපන් කරුණ රසය සහෘද හද තුළ ඔප් නැංවීම උචිත ආකෘතිය නිසා පහසුවෙන් සිදුවේ.

III. පුද්ගල වර්නනා - සාම්ප්‍රදායික ගැමි ජීවිතයේ සැබෑ ස්වරූපය පිළිඹිබු කිරීම කවියාගේ අභිප්‍රාය වී ඇත. කවියා යොදාගත් පුද්ගල වර්ණනා තුළින් එය ප්‍රබල ව ඉටු වී ඇත. සරල චාම් ගැමි ජීවන රටාව පිළිබඳ චිත්ත රූප මැවීමට සමත්වන වර්ණනා.

" මං එන තුරුම සිට පෙන්වූ සිනහ කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර මට"

"පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්විය මට සොම්නස පිරුණු ඇසින්"

අව්‍යාජත්වය - "දරටික තබා සෙවණැති පලු ගසක යට
පිස දම දමා දාඩිය එන නළල පිට"

" ආගන්තුකව එන කෙනෙකුට පුරුදු නැති
හිතවත් කමින් සැලකූ යුතුකමය සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුතී
සිහිවී මගේ කම්මුල රතු පැහැය ගතී"

IV.මුදලක් පිරිනමා ස්තුති කිරීමට කවියාගත් උත්සහය සුන්දරහාමි ප්‍රතික්ෂේප කිරිම. (ලකුණු 25)

## 111 කොටස

උචිත උදාහරන හා නියමිත වචන සංඛ්‍යාවෙන් ද හෙබි සාර්ථක පිළිතුරු සඳහා ඉහළ ලකුණු ලබා දෙන්න (ලකුණු 15 බැගින්)